හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 08 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 02 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 අභිතකර මතය**

මෙම වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලින් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 අභිතකර මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **ගිණුම්කරණ ප්‍රතිපත්ති** | | |
| | ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි. | අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කළ යුතුවේ. | පිළිගනිමි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාල උසාවි දඩ ආදායම හා සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල උසාවි දඩ ආදායම් හා මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ii) | හිඟුරක්ගොඩ පුලතිසි තාරකා මණ්ඩපයෙහි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | සභාවට අයිති ගොඩනැගිල්ලක් වන නිසා වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | වටිනාකම ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (iii) | සේවක ණය ලේඛනයේ සඳහන් රු.230,492ක ණය ශේෂයක් ගිණුම් ගත කර නොතිබුණි. | ණය ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (iv) | බැකෝලෝඩර් යන්ත්‍රයේ කුලී ආදායම් ලේඛනය අනුව, රු.52,500 ක හිඟ කුලී ආදායම් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ හිඟ කුලී ආදායම රු.72,000 ක් මූල්‍ය ප්‍රකාශනවලින් මඟහැරී තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | දේශීය ණය හා සංවර්ධන අරමුදලට අදාල ණය පොලී වියදම රු.3,786,837 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.3,431,240 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වියදම ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් සිදු කර නොතිබුණි. | විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් සිදුකළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ දී වෙන්කිරීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වත්කම් බදුදීමේ (5-23) ආදායම රු.62,230ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.376,715 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) නොසැසඳුණු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ උපලේඛනවලට අනුව හිඟ ජල විකුණුම් අදායම රු.334,270 ක් වූ නමුත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.489,928 ක් ලෙස දැක්වීමෙන් රු.155,658 ක නොසැසඳීමක් පැවතුණි. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | උපලේඛන මඟහැරී ඇත. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛනය හා සේවක ණය ලේඛනය අතර රු.509,240ක නොසැසඳීමක් පැවතුණි. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ශේෂ සටහන් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2019 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය පාලන ගිණුම අනුව රු.5,002,095 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව රු.4,846,000 ක් වූයෙන් රු.156,095 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (iv) | ස්ථාවර වත්කම් ගිණුමේ වටිනාකම ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට සමාන විය යුතු වුවත්, එම ගිණුම් දෙක අතර රු77,372,051 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ 2018 වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු හා 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශේෂයන් 10 ක රු.27,248,683 ක වෙනසක් පැවති අතර එම වෙනස්කම් සඳහා සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | කේවල ශේෂ අතර වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ලැබිය යුතු දැවල වටිනාකම රු.114,113,235 ක් වුවද, ඒ සඳහා ඉදිරිපත් කර තිබූ සටහන අනුව එහි වටිනාකම රු.36,831,560 ක් වූයෙන් රු.77,281,675 ක වෙනසක් පැවතුණි . | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. වෙනසට හේතුවූ කරුණු සොයා බැලීමට කටයුතු කරමි. |
| (vii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව ජංගම වගකීම් වටිනාකම රු.76,778,466 ක් වුවද, එයට අදාල සටහන අනුව එහි වටිනාකම රු.92,932,419 ක් වූයෙන් රු.16,153,953 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. වෙනසට හේතුවූ කරුණු සොයා බැලීමට කටයුතු කරමි. |
| (viii) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අවසාන ශේෂයන් හා ලෙජරයේ 2019 වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර ජංගම වත්කම්වල රු.4,549,597 ක් හා ජංගම වගකීම්වල රු.8,616,191 ක් වශයෙන් රු.13,165,788 ක වෙනසක් පැවතුණි. | කේවල ශේෂ අතර වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ix) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අවසාන ශේෂයන් හා ලෙජර ගිණුම්වල අවසාන ශේෂයන් අතර ජංගම නොවන වත්කම් රු.77,626,033 ක්, ජංගම වත්කම් රු.7,214,778 ක් හා ජංගම වගකීම් රු.3,798,097 ක් වශයෙන් රු.88,638,908 ක නොසැසඳීමක් පැවතුණි. | කේවල ශේෂ සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**(ඇ)** **අවිනිශ්චිත ගිණුම**

| | | |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු. 773,158 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. |

**(ඉ)** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු.472,549,774 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විස්තරාත්මක උපලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලිපි සොයාගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලෙජර් ගිණුම් තුල ශේෂ සටහන් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ජංගම වත්කම් රු.110,266,667 ක්, ජංගම වගකීම් රු.120,370,573 ක් හා හිමිකම රු.585,960,884 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට නොහැකි විය. | ලෙජර් ගිණුම් සම්පූර්ණ කර තුලනය කළ යුතුවේ. | පිළිගනිමි. |

## 1.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 126 වගන්තිය | ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකිරීම හා සතිපොළ බදුදීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි | අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |
| (ii) | 134 වගන්තිය | වරිපනම් අයකිරීම සඳහා කලින් කල දියුණු කල ප්‍රදේශ හඳුනාගෙන නොතිබුණි | දියුණු කල ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සිතියම්ගත කර පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. |
| (ආ) | 1946 අංක 30 දරණ වරිපනම් හා බදු තක්සේරුකරණ පනත | සෑම වසර 05 කට වරක් තක්සේරුවක් සිදුකර වරිපනම් අයකල යුතු වුවත්, 2003 | පනත ප්‍රකාරව තක්සේරුවක් සිදුකළ යුතුවේ. | ප්‍රතිශෝධන තක්සේරුව ආණ්ඩුකාර වරයාගේ අනුමැතියට යවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | වර්ෂයේ තක්සේරුව මත වරිපනම් අයකරමින් පැවතුණි. | | |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>--------------------- | | | |
| (i) | රීති අංක 59 - 63 | බල ප්‍රදේශය තුළ පවතින කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳව සමීක්ෂණයක් පවත්වා ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණු අතර, කර්මාන්ත බදු ගෙවීම් පැහැර හරින්නන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව සමීක්ෂණය කර වෙළඳ, ව්‍යාපාර හා කර්මාන්ත ලැයිස්තුවක් පිළියෙල කර ඒ අනුව ගාස්තු අයකළ යුතුවේ. | 2020 සඳහා මේවන විට ලේඛන පිළියෙල කර ඇත. |
| (ii) | රීති අංක 180 හා 184 | මුදල් හෝ ගබඩා කටයුතු භාරව ක්‍රියා කරන හා ආදායම් | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප අය කළ යුතුවේ. | ඇප ලබාගැනීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | එකතු කිරීමේ කාර්යයේ නිරත දැනට සේවයේ නියුතු නිලධාරීන් 05 දෙනෙකු ගෙන් පමණක් ඇප ලබාගෙන තිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ---------------------- | | | |
| (i) | 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ. 371(5) | රු.202,392 ක අත්තිකාරම් මුදල් දින 11 සිට 122 දක්වා කාල ප්‍රමාදයකින් යුතුව පියවා තිබුණි. | ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කාල ප්‍රමාදයකින් තොරව පියවා ගැනීමට කටයුතු කරමි. |
| (ii) | මු රෙ.396 | නිකුත් කල නමුත් මාස 06 ක් තුල ඉදිරිපත් නොවූ වටිනාකම රු.8,145 ක් වූ චෙක්පත් 09 ක් සම්බන්ධව මු.රෙ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. මු.රෙ. ප්‍රකාරව කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| | ප්‍රකාරව කටයුතු කර නොතිබුණි | |

**1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු ගිණුම් විෂයයන් 11 කට අදාළව එකතුව රු.120,198,519 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානය යොමුකර නොතිබුණු අතර, කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරුණි. | අයනොවූ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | දීර්ඝ කාලයක සිට පැවතෙන ශේෂ බැවින් කඩිනමින් සොයාබලා අයකර ගැනීමට කටයුතු කරමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.76,747,018 ක් වටිනා ගෙවිය යුතු ගිණුම් විෂයයන් 04 ක් නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණු අතර කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | දීර්ඝ කාලයක සිට පැවතෙන ශේෂ බැවින් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.27,579,736 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.5,981,895 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | සමුච්චිත හිඟය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,916,700 | 4,765,604 | 3,287,313 | 1,489,120 | 4,894,500 | 4,798,892 | 4,327,292 | 3,202,984 |
| කුලී | 12,426,300 | 12,971,509 | 7,752,987 | 5,218,521 | 11,670,300 | 34,597,270 | 10,355,060 | 11,546,767 |
| බලපත්‍ර ගාස්තු | 2,555,000 | - | 2,652,000 | - | 2,755,000 | - | 2,991,261 | - |
| වෙනත් ආදායම් | 23,150,000 | 14,863,174 | 24,496,880 | 22,163,174 | 18,625,000 | 17,742,991 | 31,385,626 | 29,695,423 |
| එකතුව | 43,048,000 | 32,600,287 | 38,189,180 | 28,870,815 | 37,944,800 | 57,139,153 | 49,059,239 | 44,445,174 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,944,689 වූ වරිපනම් හිඟයෙන් 2019 වර්ෂය තුළදී රු.767,151 ක මුදලක් පමණක් අයකරගෙන තිබූ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 39 ක් පමණ විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකරගැනීම සඳහා අවසන් නිවේදන බෙදමින් පවතී. රජයේ විනාශ වී ඇති දේපල සඳහා හිඟ මුදල් කපාහැරීමට මහා භාණ්ඩාගාරයට යවා ඇත. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නව වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 24 සඳහා සමාලෝචිත වර්ෂයට අය විය යුතු රු.1,951,056 ක කුලී මුදලින් කිසිදු මුදලක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබූ අතර එම හිඟ මුදල රු.627,978 ක වටිනාකමකින් යුතු ඇප තැන්පතු ද ඉක්මවා ඇති නිසා ඇප මුදල් මඟින් ද හිඟය ආවරණය කරගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල නොහැකි අය වෙත සහන කාලසීමාවන් ලබාදීම, ඇප තැන්පතු ඉක්මවා ඇති කාමර මුද්‍රා තැබීම, සිදුකර ඇත. |
| (ආ) ජයන්තිපුර උප කාර්යාලය විසින් කඩ කුලී අය කරගන්නා කඩ කාමර 13 කට අදාල රු.506,240 ක හිඟ මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණි. එම කඩ අතුරින් කඩවල් 08 ක් සඳහා නිශ්චිත කාලයක් නොමැති | ගිවිසුම් අලුත් කර හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

ගිවිසුම් පැවති අතර ඉතිරි කඩවල් 05 සඳහා ගිවිසුම් නොමැතිවීම නිසා මෙම හිඟ මුදල අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින ලැබිය යුතුව තිබූ උසාවි දඩ ආදායම් රු.14,863,174 ක් වී තිබුණි. | ලැබිය යුතු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | හඳුනාගැනීමට කටයුතු කරමි. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබවිහරණය,පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සම්මත කරගන්නා ලද අතුරු ව්‍යවස්ථාවන් 10 ක් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්මත කරගත් අතුරු ව්‍යවස්ථාවන් ගැසට් කළ යුතුවේ. | 2020 පෙබරවාරි 27 දින රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක PFD/RED/01/04/2014/01 හා 2014/02/17 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කළ යුතු කරුණු අඩංගු කර සැලැස්ම සකස් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කල යුතුවේ. | 2020 සඳහා සියල්ල ඇතුලත් කර ඇත. |

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------- |
| සභාව විසින් දීර්ඝ කාලයක සිට කසල බැහැර කරන ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කර ගැනීමට අවධානය යොමු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කළ යුතු අතර, කසල කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | අයිතිය නිරවුල් කරගැනීමට ඉල්ලා ඇත. දිරන කසල ලංකාපුර ප්‍රාදේශීය සභාවේ කොෂිමා අංගනය වෙත රැගෙන යයි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------- |
| (i) එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණද, එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර, අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. 2017, 2018 හා 2019 වර්ෂවල තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | සභාවට අදාලව අරමුණු හඳුනා ගැනීම, දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම, මූල්‍ය ප්‍රතිපාදන කිරීම සම්බන්ධිත ආයතන හඳුනාගැනීම කළ යුතුවේ. | පිළිගනිමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

**--------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------- |
| (අ) ද්විතීයික මට්ටමේ තනතුරු 12 ක් පුරප්පාඩුව පැවති අතර තනතුරු 03 ක | අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර හා සම්පූර්ණ | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට |

| | | | |
|---|---|---|---|
| | අතිරික්තයක් පැවතුණි. | කර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉල්ලීම් කර ඇත. |
| (ආ) | පුරප්පාඩුව පවතින අනුමත බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා අනියම් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණු අතර, පුරප්පාඩුව පවතින ක්ෂේත්‍ර කම්කරු තනතුරු 04 ක් සඳහා අනියම් පදනම මත නිලධාරීන් 07 ක් බඳවාගෙන තිබුණි. එමෙන්ම සෞඛ්‍ය කම්කරු තනතුරෙහි නිලධාරීන් 05 ක අතිරික්තයක් තිබියදී අනියම් පදනම මත නිලධාරීන් 06 දෙනෙකු බඳවාගෙන තිබුණි. | පුරප්පාඩු සඳහා ස්ථිර නිලධාරීන් පත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රාජකාරි ඉටු කිරීමට සේවකයින් ප්‍රමාණවත් නොවන බැවින් එම ප්‍රමාණය වැඩිකර ගැනීමට අනුමැතියට යවා ඇත. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------- |
| ජයන්තිපුර මහජන බැංකු ශාඛාවේ ගිණුමක් විවෘත නොකර ජයන්තිපුර උප කාර්යාලය මගින් දෛනිකව එකතු කරනු ලබන මුදල් ලංකා බැංකුවේ ගිණුමට බැර කර පසුව ප්‍රධාන කාර්යාලයේ මහජන බැංකු ගිණුමට මාරු කරනු ලබන නිසා මාර්ගස්ථ මුදල් ලෙස අගයන් බැංකු සැසඳුමේ සෑම මසකම පෙන්නුම් කිරීමට සිදුවී තිබුණි. | මහජන බැංකු ශාඛාවේ ගිණුමක් විවෘත කළ යුතුවේ. | ජයන්තිපුර උප කාර්යාලය මඟින් පවත්වාගෙන යනු ලබන ලංකා බැංකු ගිණුමේ මුදල් මහජන බැංකුවේ ගිණුමට මාරු කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 අභ්‍යන්තර විගණනය**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

**4.2 විගණන හා කළමණාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |

**4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණ භූමියේ ඉදිකරන ලද නීතිඥ කාර්යාල පරිශ්‍රයට අදාළ ඉඩම පවරාගෙන ඉදිකර තිබූ කඩකාමර 16 ක් සඳහා අයකරගත යුතුව තිබූ ටෙන්ඩර් ගාස්තු රු.3,465,325 ක් හා මාසිකව අයකරගත යුතුව තිබූ රු.720,000 ක කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිගනිමි. ඉදිරි කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කරමි. |
| (ආ) | කල්බදු පහසුකම් යටතේ ලබාගෙන තිබූ කැබ් රථයක් 2015 වර්ෂයේදී අනතුරට ලක්වී තිබූ අතර, රක්ෂණ හිමිකම් ලෙස සභාවට ලැබී තිබූ රු.3,300,000 මුදලක් ජංගම ගිණුමේ දිගින් දිගටම නිෂ්කාර්යව රඳවා තිබුණි. වාහනය සඳහා පූර්ණ වන්දිය ලෙස ලැබිය යුතු ඉතිරි රු.3,000,000 ක මුදල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගෙන නොතිබුණි. | පූර්ණ වන්දිය ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට කල්බදු ගෙවීම් අවසන් කර ඇති අතර, වාහනයේ පරම අයිතිය ලබාගෙන වෙන්දේසි කිරීමටත්, නව වාහනයක් ලබාගැනීමටත් අදාල ලේඛන පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |